**මහ කොළඹ අපජලය කළමනාකරණ ව්‍යාපෘතිය -2020**

**------------------------------------------------------------------------**

**මහ කොළඹ අපජලය කළමනාකරණය ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2009 දෙසැම්බර් 18 දින එළඹි අංක 2557 ණය ගිවිසුමේ 5 වන උපලේඛනයේ 26 වන වගන්තිය සහ අංක 2558 දරන ණය ගිවිසුමේ 5 වන උපලේඛනයේ 27 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**------------------------------------------------------------------------------------------**

**ණය ගිවිසුම්වලට අනුව, එවකට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ පළාත් සභා සහ පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහනගර සභාව සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සාගර හා මිරිදිය ජලයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂක තත්ත්වය වැඩිදියුණු කිරීම තුළින් මහ කොළඹ ප්‍රදේශයේ මිලියන 1.5 ක නාගරික හා උප නාගරික වැසියන්ගේ නාගරික පරිසරය සහ මහජන සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. (අ) මලාපවහන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම (ආ) වත්කම් කළමණාකරනය, මූල්‍ය කළමණාකරනය, මෙහෙයුම් කාර්යසාධනය නියාමනය, පාරසරික නියාමන අනුකූලතාවය, පාරිභෝගික සේවා සහ නිසි සනීපාරක්ෂක සේවා සැපයීමේදී ආයතනික සහ මෙහෙයුම් ධාරිතාවය ශක්තිමත් කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය සහ ආයතනික සහාය යනාදි සංරචක යටතේ වැඩසටහනේ කටයුතු ක්‍රියාත්මක කර තිබුණි. ණය ගිවිසුම්වලට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,597.11 කට සමාන එජඩො මිලියන 110.24 ක් වන අතර ඉන් රු.මිලියන 10,783.63 කට සමාන එජඩො මිලියන 94.37 ක් ආසියානු සංවර්ධන බැංකුව මඟින් මූල්‍යයනය කිරීමට එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 1,813.46 කට සමාන එජඩො මිලියන 15.87 ක් ශ්‍රී ලංකා රජය මඟින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 අප්‍රේල් 09 දින ආරම්භ කර තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දින 2021 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.**

**1.3 මතය**

**-------**

**ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 මතය සඳහා පදනම**

**--------------------**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**----------------------------------------------------------------------------------------------------**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.**

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

**2.1** ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | මුදල රු. | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ අංක **16** හි **19** වගන්තියට අනුව ආරවුල් නිරවුල් කිරීමේ කමිටුවේ සාමාජිකයෙක් වෙත ගෙවන ලද නිරවුල්කිරීමේ ගාස්තු වත්කම් ලෙස හඳුනාගත නොහැකි වුවද **2020** දෙසැම්බර් **31** දිනට මූල්‍ය ප්‍රකාශනවල එය වත්කමක් ලෙස හඳුනාගෙන තිබුණි. | **11,760,537** | ආරවුල් නිරවුල් කිරීමේ මණ්ඩලය සඳහා දරන පිරිවැය, කොන්ත්‍රාත්තුව සිදුවන අතරතුර පැන නගින පිරිවැය කොන්ත්‍රාත් පිරිවැයේ කොටසක් ලෙස තීරණය කරනු ලැබේ. | ගාස්තු වත්කම් ලෙස හඳුනාගත නොහැකි අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනම අයිතමයක් ලෙස දැක්විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව, යන්ත්‍රෝපකරණ සහ උපකරණවල අගය රු. **637,006,943** වූ අතර එය ස්ථාවර වත්කම් ලේඛණයට අනුව **15,422,266** ක් ලෙස දැක්විය. රු.**621,584,677** ක වෙනස සඳහා හේතු විගණනය වෙත පැහැදිලි කර නොතිබුණි. | **621,584,677** | ව්‍යාපෘති කළමණාකරන ඒකකයේ භාරයේ පවතින කාර්යාල උපකරණ සහ ලී බඩු පමණක් ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතුලත් කර ඇත. කොළඹ මහ නගර සභාවේ භාවිතය සඳහා ව්‍යාපෘති අරමුදල් මගින් සපයන ලද අනෙකුත් යන්ත්‍ර සහ උපකරන CMC ජලාපවහන අංශය භාරය යටතේ පවතී. මුළු වටිනාකම සඳහා සියළුම වත්කම් එකතු කරන ලද ස්ථාවර වත්කම් ලේඛණයේ පිටපතක් දැනටමත් විගණනය වෙත ඉදිරිපත් කර ඇත. | ස්ථාවර වත්කම් රු. **621,584,677** පිළිබඳ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

**2.2** රීති සහ රෙගුලාසි සමග අනුකූල නොවීම

| | රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **2019** මාර්තු **05** දිනැති අංක **2019/01** දරණ කළමණාකරන සේවා චක්‍රලේඛයේ **9.3** වගන්තිය | සමාලෝචන කමිටු මාස **02** කට වරක් පැවැත්විය යුතු වුවද **2020** වර්ෂය තුළදී සමාලෝචන කමිටු රැස්වීම් **02**ක් පමණක් පවත්වා තිබුණි. | **2020** මාර්තු මස සිට පැවති තත්ත්වය නිසා කොවිඩ් තත්ත්වය වලක්වාලීම පිළිබඳ මාර්ගෝපදේශ වලට අනුගතවෙමින් එවැනි කණ්ඩායම් සඳහා රුස්වීම් සංවිධානයට නොහැකි විය. | විකල්පයක් ලෙස මාර්ග ගත රැස්වීම් පැවැත්වීම කළ යුතුව තිබුණි. |
| (ආ) | **2019** මාර්තු **05** දිනැති අංක **2019/01** දරණ කළමණාකරන සේවා චක්‍රලේඛයේ **4.2.3** වගන්තිය | රාජ්‍ය සේවයට බාහිරින් බඳවා ගන්නා ලද සහය කාර්යය මණ්ඩලයේ වැටුප් රාජ්‍ය සේවයේ එම තනතුරේ බඳවා ගැනීමේ මට්ටමේ ආරම්භක පියවරේ වැටුප් පරිමාණය මත පදනම් විය යුතුය. කෙසේවෙතත්, එම්එන්**1 – 2006** ආරම්භක වැටුප් පරිමාණය වෙනුවට ජ්‍යෙෂ්ඨ මට්ටමේ ඩී පරිමාණය පදනම්ව **2011**දී දත්ත සැකසුම්කරුවෙකු බඳවාගෙන තිබුණි. | මෙම වැටුප් පරිමාණය මත පත්වීම් සිදුකර ඇති අතර ඒ අනුව ගෙවීම් සිදුකර ඇත. | රීති සහ රෙගුලාසිවලට අනුව වැටුප් ගෙවියයුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම් | 2020 දෙසැම්බර් 31 දිනට | | විගණන ගැටලුව | ප්‍රමාදයන් සඳහා හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත කාර්යසාධනය ප්‍රතිශතය | අත්කරගත් කාර්යසාධනය ප්‍රතිශතය | | |
| (අ) කොළඹ මහ නගර සභාවේ ප්‍රධාන මලාපවහන පද්ධතිය පුනරුත්ථාපනය කිරීම, අපජල පොම්පාගාර සහ ප්‍රධාන පොම්පාගාර ඉදි කිරීම සහ පුනරුත්ථාපනය කිරීම. | පොම්පාගාර | | | කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා, ව්‍යාපෘති ප්‍රතිපාදන, ශක්‍යතා අධ්‍යන, පාරිසරික තක්සේරුව, ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ දුර්වලතා හේතුවෙන් ව්‍යාපෘතිය 2010 අප්‍රේල් 09 දින ආරම්භකර 2015 ජුනි 30 දින නිම කිරීමට සැලසුම්කර තිබුණද 2021 දෙසැම්බර් 31 දින තෙක් නිමකිරීමේ දිනය 4වතාවක් දීර්ඝ කර තිබුණි. මෙම තත්ත්වය යටතේ ව්‍යාපෘතිය මන්දගාමීව සිදුවන ව්‍යාපෘතියක් ලෙස වාර්තා වී තිබුණි. | අඛණ්ඩව නිසි පාලනයක් සහ අධීක්ෂණයක් නොමැති වීම. |
| | වනාතමුල්ල | 100 | 96 | | |
| | මාලිගාවත්ත | 100 | 74 | | |
| | බොරැල්ල | 100 | 60 | | |
| | බම්බලපිටිය | 100 | 99 | | |
| | විට්ස්වයික් | 100 | 70 | | |
| | තිබ්රිගස්යාය | 100 | 73 | | |
| | කොම්පඤ්ඤවීදිය | 100 | 93 | | |
| | ප්‍රධාන පොම්පාගාර | | | | |
| | වනාතමුල්ල | 100 | 58 | | |
| | විට්ස්වයික් | 100 | 34 | | |
| (ආ) වනාතමුල්ල ගුරුත්වාකර්ෂණ අපවහන ජාලය වැඩිදියුණු කිරීම. | වනාතමුල්ල ගුරුත්වාකර්ෂණ අපවහන ජාලය වැඩිදියුණු කිරීම. | 100 | 68 | කොන්ත්‍රාත්තුව 2017 ජුනි 30 දින අවසන් කර තිබුණු අතර භෞතික ප්‍රගතිය සියයට 68ක් පමණක් විය. ඉතිරි වැඩ කොටස අපවහන ජාලා කටයුතු සිදු කරමින් සිටින කොන්ත්‍රාත්කරුවකු වෙත පවරා තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය විගනණය සඳහා ඉදිරිපත් කර | අඛණ්ඩව නිසි පාලනයක් සහ අධීක්ෂණයක් නොමැති වීම. |

නොතිබුණි.

| | |
|---|---|
| කළමණාකරනයේ ප්‍රතිචාරය | ඉදිරිපත් කරන ලද ප්‍රගතිය පිළිබද තොරතුරු සමග එකග වේ. |
| විගණකගේ නිර්දේශ | ව්‍යාපෘති කාලපරිජේදය ඉකුත්වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |

**3.2** ඌනඋපයෝජිත සම්පත්

| විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| මහා භාණ්ඩාගාරය **2010** පෙබරවාරි **15** දින සිට **2020** අගෝස්තු **15** දක්වා OCR ණය මුදලේ ලබා නොගත් ණය ශේෂය මත රු. **118,596,882** ක බැදීම් ගාස්තු ගෙවා තිබුණි. | බැදීම් ගාස්තු පිරිවැය වැලැක්විය නොහැක. ණය වියපැහැදම් වීමේ ප්‍රමාදය හේතුවෙන් අමතර පිරිවැයක් දැරූ බව එකගවේ. කෙසේවෙතත්, බැදීම් ගාස්තු ගෙවීම් කටයුතු වල විෂය පථය සීමා කිරීමට හෝ ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට බලපානු නොලැබේ. | නිසි ව්‍යාපෘති සැලසුම්කරණයක් මගින් මෙම පිරිවැය අවම කරගත යුතුය. |

**3.3** මතභේදයට තුඩුදෙන ගැටලු

| | විගණන ගැටලු | කළමණාකරනයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය **2010** අප්‍රේල් **09** දින ආරම්භකර **2015** ජුනි **30** දින නිම කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේවෙතත්, **2021** දෙසැම්බර් **31** දින තෙක් අවස්ථා **4**කදී මාස **78**කින් ව්‍යාපෘතියේ කාලපරිච්ඡේදය දීර්ඝ කිරීම හේතුවෙන් **2020** දෙසැම්බර් **31** දිනට උපදේශන සේවා සදහා ගෙවන ලද මුදල රු.**1,066,143,754** විය. ණය ගිවිසුම අනුව උපදේශන සේවා සදහා වෙන් කරන ලද මුදල රු. **935,870,000** පමණක් වන අතර **2020** දෙසැම්බර් **31** දිනට රු. **130,273,754** ක අමතර ගාස්තුවක් ගෙවා තිබුණි. | උපදේශන සේවා සදහා සැලකිය යුතු පිරිවැයක් දරා තිබුණු බව පිළිගනු ලැබේ. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය සහ සිදු කරමින් පවතින කොන්ත්‍රාත්වල දුර්වල කාර්යසාධන හේතුවෙන් ප්‍රධාන වශයෙන් මෙය සිදුවී ඇත. කෙසේවෙතත්, උපදේශන සේවා සදහා වෙන් කරන ලද ප්‍රතිපාදන ඉක්මවූ බව නිවැරදි නොවේ. | ව්‍යාපෘති කාලපරිජේදය ඉකුත්වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) | **2020** වර්ෂයේ ප්‍රතිපත්ති සහයක කණ්ඩායමේ නිලධාරීන් **7** දෙනකු සදහා රු.**5,096,000**ක් ගෙවා තිබුණු අතර අවස්ථා **2** කදී රැස්වීම් **2**ක් පමණක් පවත්වා තිබුණි. **2020** දෙසැම්බර් **31** වන විට ව්‍යාපෘතිය නිමකර මාස **66** ක් ගතවී තිබුණද ප්‍රතිපත්ති සහයක කණ්ඩායම සදහා රු **38,730,786** ක මුදලක් ව්‍යාපෘතිය ආරම්භයේ සිට **2020** දෙසැම්බර් **31** දක්වා ගෙවා තිබුණි. ප්‍රතිපත්ති සහයක කණ්ඩායමේ කාර්යසාධන වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ව්‍යාපෘති සදහා ප්‍රතිපත්ති සහයක කණ්ඩායමේ දායකත්වය ඇගයීමට නොහැකිවිය. | ප්‍රතිපත්ති සහයක කණ්ඩායමට පොදු වැඩ සහ විවිධ වගකීම් භාර දී ඇත. එම නිසා කාර්යසාධන ඇගයීමේ ක්‍රමය යොදා ගැනීමට නොහැකි වේ. කෙසේවෙතත්, කණ්ඩායමේ සියළුම සාමාජිකයින් ඔවුන්ගේ ස්ථිර තනතුරෙහි රාජකාරී වලට අමතරව ව්‍යාපෘතියේ සමහර කටයුතු සමග සම්බන්ධ වූ බව දන්වනු කැමැත්තෙමි. | ප්‍රතිපත්ති සහයක කණ්ඩායම ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියාකාරීව දායක විය යුතු අතර ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීම සිදු කල යුතුය. |

**3.4 පාරිසරික කරුණු සම්බන්ධ ගැටලු**

| විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| 2018 ඔක්තෝබර් 22 දින සිට බලපැවැත්වෙන පරිදි ව්‍යාපෘතියේ පරිසර නිලධාරියා පුරප්පාඩුව පැවතුණු අතර 2020 දෙසැම්බර් 31 දින තෙක් පුරප්පාඩු තනතුර පුරවා නොතිබුණි. | ව්‍යාපෘතිය තනතුර සඳහා සුදුසු පුද්ගලයකු බඳවා ගැනීමට සියළුම පියවරයන් ගනු ලැබූ අතර විවිධ හේතූන් නිසා එය අසාර්ථක විය. | ව්‍යාපෘතියේ කටයුතු පරිසරයට සංවේදී බැවින් මෙම අවශ්‍යතාවය අනිවාර්ය වේ. එම නිසා පරිසර නිලධාරියකු බඳවා ගැනීම සඳහා කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |

**3.5 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටලු**

| කාර්ය මණ්ඩල තනතුරු | තනතුරු ගණන 2020 දෙසැම්බර් 31 දිනට අනුමත | තත්‍ය | පුරප්පාඩු සංඛ්‍යාව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක | 01 | - | 01 | ව්‍යාපෘතියේ පුරප්පාඩු නොපිරවීම ව්‍යාපෘතියේ එදිනෙදා කටයුතු සඳහා අහිතකර ලෙස බලපාන බව සත්‍යයක් වේ. | සුදුසු කාර්යමණ්ඩලයක් සහිතව පුරප්පාඩු 15 පිරවීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| ව්‍යාපෘති ඉංජිනේරු (ප්‍රසම්පාදන) | 01 | - | 01 | | |
| ව්‍යාපෘති ඉංජිනේරු (සිවිල්) | 05 | 03 | 02 | | |
| ව්‍යාපෘති ඉංජිනේරු (යාන්ත්‍රික) | 02 | 01 | 01 | | |
| ව්‍යාපෘති ඉංජිනේරු | 01 | - | 01 | | |
| පරිසර නිලධාරි | 01 | - | 01 | | |
| ව්‍යාපෘති ලේකම් | 02 | 01 | 01 | | |
| සහකාර ව්‍යාපෘති ඉංජිනේරු | 05 | 03 | 02 | | |
| කළමණාකාර සහකාර | 05 | 03 | 02 | | |
| රියදුරු | 02 | - | 02 | | |
| | <u>27</u> | <u>12</u> | <u>15</u> | | |